# සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙල 2025 – ජාතික වටය

| විදුහලේ නම | ශීර්ෂ අංකය | ශීර්ෂ නාමය |
|---|---|---|
| | | |

| ඉහත නිර්මාණය ඉදිරිපත් කරවීමේ ප්‍රධාන වගකීම භාර ගුරුභවතාගේ නම | ගුරු භවතාගේ ජා.හැ. අංකය | ගුරු භවතාගේ අත්සන |
|---|---|---|
| | | |

## 09/2025 චක්‍රලේඛයේ 9.10 වගන්තියට අනුව සිදු කරන විදුහල්පති විශේෂ ප්‍රකාශය

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2025 වර්ෂය වෙනුවෙන් සංවිධානය කරන සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙලෙහි දෙවන අදියර සඳහා මාගේ විදුහල සහභාගී කරවීමට අදාලව පහත කරුණු ප්‍රකාශ කරමි.

- උක්ත උළෙලට පාදක වන චක්‍රලේඛයෙහි, මාගේ විදුහලෙන් ඉදිරිපත් කරන නිර්මාණයට අදාල කොන්දේසි පිළිබඳව මම දැනුවත් වන අතර කැඳවීම් ලිපිය සමග එවා ඇති සියලු ලේඛන මා පෞද්ගලිකවම අධ්‍යයනය කොට ඒවායෙහි සඳහන් කරුණු පිළිබඳව දැනුවත්ව සිටිමි.
- මීට පෙර එවන ලද අයදුම්පතෙහිද ප්‍රකාශ කළ පරිදි සහ අංක 09/2025 දරන චක්‍රලේඛයෙහි 9.4 වගන්තියට අනුව ඇගයීම් මණ්ඩලයේ තීරණය කොන්දේසි විරහිතව පිළිගැනීමට මමත්, මාගේ විදුහලෙන් මෙම උළෙල නියෝජනය කරවන සියලු දෙනාත් බැඳී සිටින බව ප්‍රකාශ කරමි.
- විනිශ්චය මණ්ඩලයේ ගරුත්වයට හා උළෙලේ සංවිධාන කටයුතුවලට බාධාකාරී කිසිදු කටයුත්තක් මාගේ විදුහල නියෝජනය කරන කණ්ඩායම අතින් සිදු නොවන පරිදි අදාල උපදෙස් ලබා දුන් බව ප්‍රකාශ කරමි.
- අධ්‍යාපන අමාත්‍යාංශයීය රාජකාරියක් වන මෙම නාට්‍ය ඇගයීම මහජනයාට ප්‍රසිද්ධ පොදු අවස්ථාවක් නොවන බව මා හොඳින් දන්නා අතර, පාසල පාර්ශවයෙන් ඡායාරූප ශිල්පීන් සහ ජනමාධ්‍යවේදීන් මේ සඳහා සහභාගී නොකරවන බව ප්‍රකාශ කරමි.
- අපගේ විදුහලේ නිර්මාණයන් පිළිබඳව සහ මෙම නාට්‍ය උළෙල පිළිබඳව, උළෙලේ චක්‍රලේඛයට අනුකූල නො වන, සාවද්‍ය තොරතුරු ප්‍රකාශ කරවන හෝ වෙනත් පාර්ශවයකට හානිකර හෝ ප්‍රකෝපකාරී ස්වභාවයේ සමාජ මාධ්‍ය ජාල භාවිතයක් විදුහලේ කවර හෝ පාර්ශවයක් අතින් සිදු නො වීමට වග බලාගන්නා බවට සහතික වෙමි.
- මාගේ විදුහලේ නාට්‍ය අංගය ඉදිරිපත් කිරීමේ කිසිදු කටයුත්තකට නාට්‍ය ක්ෂේත්‍රයේ ශිල්පීන්, වෙනත් බාහිර පුද්ගලයන් හෝ දරුවන්ගේ දෙමාපියන් ඇගයීම් මධ්‍යස්ථානයේ දී සහභාගී කර නොගන්නා බව ප්‍රකාශ කරන අතර බැහැර සිට දරුවන් අංග රචනය සිදු කර නො එවන බව ප්‍රකාශ කරමි.
- මාගේ විදුහලෙන් උක්ත නිර්මාණය ඉදිරිපත් කරන කණ්ඩායමේ විනය සහ ආචාරශීලී හැසිරීම සම්බන්ධ වගකීම විදුහල්පති වශයෙන් මා භාර ගන්නා අතර, ඊට අදාලව චක්‍රලේඛයෙහි සඳහන් කොන්දේසි පිළිබඳව මම විශේෂයෙන් දැනුවත් බව ප්‍රකාශ කරමි.
- අප විදුහලෙන් ඉදිරිපත් කරන නිර්මාණය අදාල චක්‍රලේඛයට අනුකූලව පවත්වා ගැනීමට මෙම නාට්‍යයේ නිර්මාණාත්මක හා සංවිධානාත්මක වගකීම් පැවරුණු සියලු ගුරුභවතුන් කටයුතු නොකළහොත්, එම ගුරුභවතුන්ට හිමි ඇගයීම් අහෝසි කිරීමටත්, වරදේ බරපතලකම අනුව අවශ්‍ය විනය පියවර ගැනීමටත් අංක 09/2025 දරන චක්‍රලේඛයෙහි 9.11 වගන්තියට අනුව මෙම අමාත්‍යාංශය කටයුතු කරනු ඇති බව ඔවුන්ට පහදා දුනිමි.

ඉහත සඳහන් සියලු කරුණු පිළිබඳව සහ උපදෙස් රැස්වීමෙහි ලබා දුන් ලේඛනවල කරුණු පිළිබඳව මාගේ විදුහලෙන් උක්ත නිර්මාණයට සහභාගී කරවන කණ්ඩායම හොඳින් දැනුවත් කොට ඇති බව ප්‍රකාශ කරමි. එමෙන්ම මවිසින් මෙතෙක් ප්‍රකාශිත කරුණුවලට සපුරා අනුගතව සහ අනුකූලව මාගේ විදුහලෙන් ඉදිරිපත් කරන නිර්මාණය අදාල ඇගයීම් මධ්‍යස්ථානයේ දී ඉදිරිපත් කරවීමේ සමස්ත වගකීම මෙම පත්‍රිකාවේ ඉහතින් නම සඳහන් අප විදුහලේ ගුරු භවතා ප්‍රමුඛව සහභාගී වන අන් ගුරුභවතුන් වෙත පවරා ඇති බවද වැඩිදුරටත් සඳහන් කරමි.

විදුහල්පතිගේ නම: පෞද්ගලික දුරකථන අංකය :

අත්සන: දිනය :

නිල මුද්‍රාව: